# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 12 සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1. සීමිත තිස්ස පොදු සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දැනට හඳුනාගෙන ඇති ලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම පිළිවෙලින් රු. 3,750,000 ක් සහ රු. 400,000 ක් විය. වෙනත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනාගෙන ඇත්තේ ඉඩම් ප්‍රත්‍යාගණනයෙන් සිදු වූ අතිරික්තයයි. මෙම සමාගමේ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් සිදු වූ රු. 500,000 ක ඌනතාවය ඉඩම් ප්‍රත්‍යාගණනයේදී සිදු වූ අතිරික්තයට හිලව් කොට ඉතිරි අගය පමණක් වෙනත් විස්තීර්ණ ආදායම ලෙස හඳුනාගෙන ඇත.

   2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ලාභය හා මුළු විස්තීර්ණ ආදායම වන්නේ,

| | වර්ෂයේ ලාභය (රු'000) | මුළු විස්තීර්ණ ආදායම (රු'000) |
|---|---|---|
| (1) | 3,250 | 3,650 |
| (2) | 3,250 | 4,150 |
| (3) | 4,250 | 4,650 |
| (4) | 4,250 | 3,750 |
| (5) | 4,150 | 5,050 |

2. සී/ස විශ්ව පොදු සමාගමේ ගිණුම් පොත් වලින් 2020.04.01 දිනට පහත ශේෂ උපුටා ගන්නා ලදි.

| | |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. 2,500,000 |
| රඳවාගත් ඉපැයුම් | රු. 1,900,000 |

   2020.06.01 දින කොටස් 28,000 ක් කොටසක් රු. 20/= ප්‍රතිෂ්ඨාවට සංචිත ප්‍රාග්ධනිත කරන ලදි. එසේම 2020.10.01 දින රු. 25/= ක ප්‍රතිෂ්ඨාවක් යටතේ කොටස් 20,000 ක් හිමිකම් කොටස් නිකුතුවක් සම්පූර්ණ කරන ලද 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් බදු වටිනාකම රු. 450,000 ක් වූ අතර, කාලච්ඡේදයේ ලාභය රු. 1,250,000 ක් විය. ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය රු. 1,300,000 ක් විය. 2021.03.31 දිනට පහත දෑ සඳහන් කරන්න.

   (1) ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් .........................
   (2) මුළු සංචිත වල වටිනාකම - ..................................

3. සී/ස පස්දුන් රට සමාගමේ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙන් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් උපුටා ගත් තොරතුරු කීපයක් පහත පරිදි වේ.

- ලාභ හෝ අලාභ ප්‍රකාශය උද්ධෘත (රු'000)

<u>වෙනත් ආදායම්</u>

| | |
|---|---|
| ලද ලාභාංශ | 56 |
| යන්ත්‍ර විකිණීමේ ලාභය | 480 |
| කුලී ආදායම | 125 |

- මූල්‍ය තත්ත්ව උද්ධෘත (රු'000)

| | 2021.03.31 | 2020.03.31 |
|---|---|---|
| මෝටර් රථ | 4,880 | 3,500 |
| මෝටර් රථ ක්ෂය වෙන් කිරීම් | (750) | (500) |
| යන්ත්‍ර උපකරණ | 3,000 | 4,100 |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් | (1,200) | (1,050) |

අතිරේක තොරතුරු,

- වර්ෂයේ ක්ෂය යන්ත්‍ර උපකරණ රු.245,000ක් හා මෝටර් රථ ක්ෂය රු. 200,000 ක් විය.

LKAS – 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) ප්‍රමිතිය අනුව යන්ත්‍ර අපහරණය තුළින් ලද මුදල් වටිනාකම වන්නේ,

(1) රු. 1,285,000 (2) රු. 900,000 (3) රු. 1,200,000

(3) රු. 1,380,000 (5) රු. 1,485,000

4 හා 5 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සී/ස මිෂෙල් පොදු සමාගමේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශ වලින් ලබාගත් තොරතුරු පහත දැක්වේ.

| | 2022.03.31 | 2021.03.31 |
|---|---|---|
| කොටස් ප්‍රාග්ධනය | 800,000 | 600,000 |
| පොදු සංචිත | 100,000 | 300,000 |
| යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණන සංචිත | 300,000 | 400,000 |
| රඳවාගත් ඉපයුම් | 800,000 | 600,000 |

2021/22 වර්ෂය තුළ සංචිත ප්‍රාග්ධනිතයක් සිදු කර ඇති අතර, සමාගම කොටස් හිමියන්ට රු 150,000 ක අතුරු ලාභාංශයක් ගෙවූයේ නම් හා යන්ත්‍ර දෙවන වරට ප්‍රත්‍යාගණනය කර 100,000 ක ප්‍රත්‍යාගණන අලාභයක් ජනිත වූයේ නම්,

4. 2022.03.31 න් අවසන් වර්ෂයේ කාලච්ඡේදයේ ලාභය හා මුළු විස්තීරණ ආදායම වන්නේ,

| | කාලච්ඡේදයේ ලාභය | මුළු විස්තීරණ ආදායම |
|---|---|---|
| (1) | 500 | 400 |
| (2) | 200 | 100 |
| (3) | 350 | 100 |
| (4) | 250 | 350 |
| (5) | 350 | 250 |

5. වර්ෂය තුළ සිදු වූ සංචිත ප්‍රාග්ධනිතයේ වටිනාකම වන්නේ,

(1) 200,000 (2) 50,000 (3) 100,000

(4) 150,000 (5) 350,000

ප්‍රශ්න අංක 6 හා 7 සඳහා පහත තොරතුරු යොදා ගන්න.

සී/ස දේවා පොදු සමාගම 2021.03.31 දිනට නිකුත් කළ ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රු 200,000 ක් විය. එහි එක් කොටසක වටිනාකම රු.10 කි. මෙම සමාගම සිය ප්‍රත්‍යාගණන සංචිත හා පොදු සංචිත භාවිතා කරමින් 2022.06.30 දින 5:1 අනුපාතයට රු.20 සාමාන්‍ය කොටස් ප්‍රමාණයක් ප්‍රසාද ලෙස නිකුත් කරන ලදි. එසේම 2022.07.01 දිනට පැවති මුළු සාමාන්‍ය කොටස් මත 6:1 අනුපාතයට රු.18 බැගින් හිමිකම් නිකුතුවක් ද සිදුකරන ලදි. හිමිකම් නිකුතුවට අදාළ සියළු කොටස් කොටස් කරුවන් විසින් මිලදී ගන්නා ලදි.

6. ප්‍රසාද නිකුතුවෙන් පසු සාමාන්‍ය කොටස් ප්‍රමාණය හා ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධනයේ අගය වනුයේ,

| | සාමාන්‍ය කොටස් ප්‍රමාණය | ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධනය |
|---|---|---|
| (1) | 24,000 | 200,000 |
| (2) | 28,000 | 352,000 |
| (3) | 24,000 | 280,000 |
| (4) | 20,000 | 280,000 |
| (5) | 24,000 | 152,000 |

7. 2022.07.01 දිනට සිදුවූ හිමිකම් නිකුතුව නිසා සමාගමේ හිමිකමෙහි සිදුවූ වැඩි වීම වනුයේ,

(1) 80,000 (2) 152,000 (3) 272,000

(4) 72,000 (5) 272,000

ධාතීව හා වාසාර අධ්‍යයන ශාඛාව

මෙම තොරතුරු ප්‍රශ්න අංක 8 හා 9 ට පිළිතුරු ලිවීමට යොදා ගන්න.

2022.03.31 න් අවසන් වර්ෂයේ සී/ස අමන්දි පොදු සමාගමට අදාළව පහත තොරතුරු දී ඇත.

| | හර | බැර |
|---|---|---|
| බදු පෙර ලාභය | | 980,000 |
| 2021.04.01 දිනට බදු වෙන්කිරීම් | | 50,000 |
| ගෙවූ බදු | 210,000 | |

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගෙවූ බදු තුළ 2020/21 වර්ෂයේ ගිණුම් වර්ෂය සඳහා ගෙවූ 55,000 ක බදු මුදලක්ද ඇත. 2022.03.31 දිනෙන් අවසන් කාර්තුව සඳහා බදු වගකීම රු 35,000 ක් ලෙස තක්සේරු කර ඇත.

8. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ කාලච්ඡේදයේ ලාභය වන්නේ,

(1) 770,000 (2) 785,000 (3) 780,000

(4) 775,000 (5) 735,000

9. 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්විය යුතු බදු වගකීම වන්නේ,

(1) 50,000 (2) 85,000 (3) 35,000

(4) 15,000 (5) 90,000

අංක 10 හා 11ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු යොදා ගන්න.

| | (රු'000) |
|---|---|
| කාලච්ඡේදයේ ලාභය | 1,400 |
| ආදායම් බදු ගෙවීම | 300 |
| ලාභාංශ ගෙවීම | 100 |
| රඳවාගත් ඉපයුම් (2021/4/1 දිනට) | 1,800 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණන සංචිතය (2021/4/1 දිනට) | 300 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 2,000 |

2022/03/31 දිනෙන් අවසන් වර්ෂයේ මෝටර් රථ ප්‍රත්‍යාගණනයෙන් රු.200,000ක අලාභයක් වාර්තා කර ඇති අතර, යන්ත්‍ර ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනයෙන් රු.100,000ක ලාභයක් වාර්තා වේ.

10. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන වෙනත් විස්තීරණ ආදායම හා මුළු විස්තීරණ ආදායම කොපමණද? (රු'000)

| | වෙනත් විස්තීරණ ආදායම | මුළු විස්තීරණ ආදායම |
|---|---|---|
| (1) | 100 | 1,500 |
| (2) | (100) | 1,300 |
| (3) | (100) | 1,000 |
| (4) | 100 | 1,200 |
| (5) | 100 | 1,000 |

11. 2022/03/31 දිනට සමාගමේ මුළු හිමිකම වන්නේ (රු'000),

(1) 5,600 (2) 5,500 (3) 5,200

(4) 5,400 (5) 5,300

12. සීමිත රන් පොකුණ පොදු සමාගමේ 2022.03.31 දිනෙන් අවසන් වසර සඳහා ගණනය කරන ලද කාලපරිච්ඡේදයෙහි මුළු විස්තීරණ ආදායම රු. 5,050,000 කි.

සමාගම ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කර ඇති අතර ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 500,000 ක් විය. තවද මෝටර් රථ දෙවන වරට ප්‍රත්‍යාගණනය කර ඇති අතර එහිදී හඳුනාගත් මෝටර් රථ ප්‍රත්‍යාගණන ඌනතාව රු. 350,000 කි. ඒ සම්බන්ධව අදාළ ගැලපීම ආදායම් ප්‍රකාශනයේ වියදම් තුළ හඳුනාගෙන ඇත. මෝටර් රථ පළමු ප්‍රත්‍යාගණනයෙන් හඳුනාගත් අතිරික්තය රු. 200,000 කි.

කාලපරිච්ඡේදයෙහි ලාභය හා විස්තීරණ ආදායම ලෙස හඳුනාගත් නිවැරදි අගයන් විය යුත්තේ පිළිවෙලින්,

| | කාලච්ඡේදයේ ලාභය | විස්තීරණ ආදායම |
|---|---|---|
| (1) | 4,550,000 | 500,000 |
| (2) | 4,750,000 | 300,000 |
| (3) | 4,550,000 | 300,000 |
| (4) | 4,200,000 | 150,000 |
| (5) | 4,000,000 | 350,000 |

13. 2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයක් පහත තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| වර්ෂයේ ලාභය | 400,000 |
| වර්ෂයේ බදු වියදම | 40,000 |
| මුළු ආදායම තුළ ඇතුළත් වෙනත් ආදායම් | |
| මෝටර් රථ විකිණීමේ ලාභය | 200,000 |
| ලැබූ ලාභාංශ | 20,000 |
| මුළු වියදම තුළ ඇති ක්ෂය වියදම | 50,000 |
| වර්ෂය අවසානයේ තොගයේ ශුද්ධ වැඩිවීම | 25,000 |
| ණයහිමියන්ගේ ශුද්ධ අඩුවීම | 15,000 |
| ණයගැති ශුද්ධ අඩුවීම | 12,000 |

වසර අවසානයේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වන්නේ,

(1) 160,000
(2) 438,000
(3) 162,000
(4) 190,000
(5) 218,000

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව